# උරපොදි සංචාරකයන්ගෙන් ශ්‍රී ලංකාවේ සංචාරක කර්මාන්තයට සිදුවන බලපෑම

එස්.වී.සී.ඒ. දේවින්දි[1]

සංචාරක කර්මාන්තය යනු වර්තමානයේ දී ලෝකයේ සියලු රටවල්වලට අත්‍යාවශ්‍ය කර්මාන්තයකි. බොහෝ සංවර්ධිත රටවල් සංචාරක උත්පාදන රටවල් වන අතර සංවර්ධනය වෙමින් පවතින රටවල් සංචාරක ගමනාන්ත වශයෙන් හඳුනාගත හැකිය. තුන් වැනි ලෝකයේ රටවල් අතරින් විශාල ප්‍රමාණයක් තම දළ දේශීය ආදායම වර්ධනය කර ගැනීමට සිදුකරනු ලබන කර්මාන්තවලින් ප්‍රමුඛස්ථානය සංචාරක කර්මාන්තය සඳහා ලබා දී ඇත. මේ අනුව ශ්‍රී ලංකාව ද ආකර්ෂණීය සංචාරක ගමනාන්තයක් ලෙස ලොව පුරා ප්‍රසිද්ධ වී පැවතිණි. ශ්‍රී ලංකාවේ දකුණු වෙරළබඩ තීරය සංචාරක කර්මාන්තය සඳහා විශේෂ ප්‍රසිද්ධියක් උසුලයි. ශ්‍රී ලංකාවේ සංචාරක කර්මාන්තය වර්ධනය වීම සමඟ සංචාරක කර්මාන්තය ආශ්‍රිතව නව ප්‍රවණතා හා විවිධ සංචාරක වර්ගීකරණයන් බිහිවිය. එවැනි එක් සංචාරක වර්ගයක් වශයෙන් උරපොදි සංචාරකයන් හෙවත් Backpacker සංචාරකයන් හඳුනාගත හැකිය. ශ්‍රී ලංකාවේ දකුණු වෙරළබඩ කලාපයේ මිරිස්ස ප්‍රදේශය තුළ මෙවැනි උරපොදි සංචාරකයන්ගේ පැමිණීම විශාල වශයෙන් වර්ධනය වී ඇත. උරපොදි සංචාරකයෙකු ලංකාවට පැමිණීම මඟින් ලංකාවේ සංචාරක කර්මාන්තයට පාරිසරික, සමාජීය සහ ආර්ථිකමය වශයෙන් බලපෑම් ඇතිවන අතර එම බලපෑම් ධනාත්මක හා ඍණාත්මක වශයෙන් වර්ගීකරණය කිරීම කළ හැකිය. මෙම අධ්‍යයනයේ ප්‍රධාන අරමුණ වන්නේ එම ධනාත්මක හා ඍණාත්මක බලපෑම් සංසන්දනාත්මකව අධ්‍යයනය කිරීමය. දත්ත එක්රැස් කිරීම සඳහා ප්‍රශ්නාවලිය, සම්මුඛ සාකච්ඡා හා නිරීක්ෂණ යොදාගෙන ඇත. ද්විතීක දත්ත වශයෙන් පර්යේෂණ නිබන්ධ, පොත්පත්, සඟරා, අන්තර්ජාල තොරතුරු, මෙන්ම ආයතනික වාර්තා යොදාගෙන ඇත. සමීක්ෂණ දත්ත ඉදිරිපත් කිරීම සඳහා ප්‍රස්තාර භාවිත කර ඇති අතර දත්ත විශ්ලේෂණය කිරීම සඳහා මයික්‍රොසොෆ්ට් එක්සෙල් මෘදුකාංගය හරහා විස්තරාත්මක විශ්ලේෂණ ක්‍රමය භාවිතා කර ඇත. මොවුන් අඩු වියදම් සංචාරකයන් වන බවත් මොවුන්ගෙන් හිමිවන ආදායම් ඍජුවම ප්‍රාදේශීය ජනතාව වෙත හිමිවන බවත් මෙහි දී හඳුනාගත හැකි විය. එමෙන්ම මෙම සංචාරකයන් හේතුවෙන් එම ප්‍රදේශය තුළ මත්ද්‍රව්‍ය භාවිතයේ ඉහළයාමක් දක්නට ලැබෙන් අතරම Beach Boys සමඟ වැඩි වශයෙන් ගැවසීම හේතුවෙන් පවුල් කුටුම්භ තුළ ගැටළු ඇති වී ඇත. කෙසේ වෙතත් මොවුන් පරිසර හිතකාමී සංචාරකයන් ලෙස හඳුනාගත හැකිය. මෙලෙස ධනාත්මක බලපෑම් වැඩිදියුණු කරගැනීමටත් ඍණාත්මක බලපෑම් අවම කරගැනීමටත් කටයුතු කළ යුතු ආකාරය මෙහි පෙන්වා දී තිබේ. මෙය ලංකාවේ සංචාරක කර්මාන්තයට ධනාත්මක අයුරින් යොදාගත හැක්කේ කෙසේ ද යන්න මෙහි විග්‍රහ කර ඇත.

ප්‍රමුඛ පද : උරපොදි සංචාරකයන්, ධනාත්මක හා ඍණාත්මක බලපෑම්, සංචාරක කර්මාන්තය, වෙරළබඩ කලාපය

[1] සංචාරණ හා සංස්කෘතික සම්පත් කළමණාකරණය, කැලණිය විශ්වවිද්‍යාලය.devindi.chamadi@gmail.com